ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2023-04-04

පැමිණිලි පාර්ශවය = එම්.ආර්.පී.එම්.ආර්. බණ්ඩාර මයා.
නො 106, මාදෙයියාව පාර,
කෑගල්ල.

වගඋත්තර පාර්ශවය - 01 විදුහල්පති,
කෑගලු විද්‍යාලය,
කෑගල්ල.

02 අධ්‍යක්ෂ (ජාතික පාසල් ශාඛාව),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය = HRC/1126/22**

**පැමිණිල්ලේ කරුණු සැළ කිරීම =:**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම කොමිෂන් සභාව වෙත 2022-04-18 දාතමින් ඉදිරිපත් කර ඇති සිය මුල් පැමිණිල්ලේ සහ එම පැමිණිල්ලට අදාළව වැඩිදුර විමර්ශනයේදී ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ, තම පුත්‍රයා වන කණිෂ්ක ගිනාත් බණ්ඩාර දරුවා 2022 වසරේ කෑගලු විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පැමිණිල්ලේ සඳහන් පදිංචි ලිපිනයෙන් පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ බවයි.

තවද එම අයදුම් පත්‍රය සම්බන්ධයෙන් පැවති සම්මුඛ පරීක්ෂණයේදී හිටපු විදුහල්පතිවරයා ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තමන් වෙත මුළු ලකුණු 90 ක් ලබාදී ඇති බවත්, ඒ අනුව තාවකාලික ලේඛන ප්‍රසිද්ධ කිරීමේදී තම දරුවාගේ නම එම ලේඛනයෙන් ඉවත් කර තිබූ බවත්ය. පසුව තමාට එරෙහිව විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති බව පවසමින් අභියාචනා විරෝධතා පරීක්ෂාවට ද



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කැඳවන ලද බවත්, එහිදී අභියාචනා විරෝධතා මණ්ඩලය තමන් වෙත මූලින් ලබාදී ඇති මුළු ලකුණු 90 ක ප්‍රමාණය වෙනස් නොකළ බව පවසන ලද බවත් දක්වා ඇත. කෙසේ වෙතත් අවසන් ලේඛන ප්‍රසිද්ධ කිරීමේදී තම දරුවාගේ නම පොරොත්තු ලේඛනයට ඇතුළත් කර තිබූ බවත්, අවසන් ලේඛන ප්‍රසිද්ධ කිරීමට පෙර දිනයේ විදුහල්පතිවරයා තමන් වෙත දුරකථනයෙන් අමතා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් තමන් වෙත දන්වා ඇති පරිදි පැමිණිලිකරු බණ්ඩාර වන තමාගේ දරුවා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත්ව තිබූ විරෝධතාවයක් පරිදි තම ලකුණු ප්‍රමාණය අඩු කර ඇති බවත්, ඒ අනුව තම දරුවාගේ නම පොරොත්තු ලේඛනයට ඇතුළත් කිරීමට සිදුවූ බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත් තමන් සම්බන්ධයෙන් විරෝධතාවයක් ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කර ඇති පී 70/1. පුවක්දෙණිය. කැගල්ල ලිපිනයේ පදිංචි පී.කේ.ආර්.ජේ.කුමාර නමැති අය සම්බන්ධව තමන් විසින් සිදු කළ සොයා බැලීමේදී ඔහු පොලිස් දෙපාර්තමේන්තුවට අයත් පොලිස් විශේෂ කාර්ය බලකායේ සේවය කරනු ලබන අයෙක් බවත් ඔහුගේ දරුවා කැගලු විද්‍යාලයේ 2022 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුවත්, එම දරුවා වෙනත් පාසලකට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බැවින් කැගලු විද්‍යාලයට ඔහුගේ දරුවා ඇතුළත් කිරීම සම්බන්ධව උනන්දුවක් නොදක්වන බවට තමන් හා ප්‍රකාශ කළ බවත්, විදුහල්පති වීරසිංහ මහතා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීමෙහි අන්තර්ගත කර ඇති විරෝධතා ඉදිරිපත් කරන්නා පිළිබඳ විස්තර ඇතුළත් පෝරමයේ තමාගේ නම නිවැරදිව සඳහන් කර නොමැති බවත් ලිපිනය නිවැරදි වුවත් තමන් එවැනි ආකාරයේ විරෝධතාවයක් මෙම පැමිණිලිකරු වන බණ්ඩාර මහතා සම්බන්ධයෙන් ඉදිරිපත් කර නොමැති බවත් ප්‍රකාශ කර ඇත. ඒ සම්බන්ධව ඔහු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් ද කරුණු ඉදිරිපත් කර ඇත.

පසුව පැමිණිලිකරු විසින් මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතද අභියාචනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළත් එයින්ද සහනයක් සලසා නොදුන් බැවින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවට දක්වා ඇති අතර, මේ සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් සිදු කර තම දරුවා කැගලු විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලා ඇත.

වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු සැළ කිරීම =:

විදුහල්පති (වැ.බ.) කැගලු විද්‍යාලය, නිමල් වීරසිංහ මහතාගේ කරුණු දැක්වීම -

මෙම පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාවේ දැන්වීම පරිදි ඉහත නම් සඳහන් කැගලු විද්‍යාලයේ හිටපු වැඩ බලන විදුහල්පතිවරයා 2022-06-09 දාතමින් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම මගින් ප්‍රකාශ කර ඇත්තේ, පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ තම පාසලේ

2022 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා පැමිණිලිකරු වන බණ්ඩාර මහතා ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍රය සලකා බලා සම්මුඛ පරීක්ෂණයේදී මුළු ලකුණු 90 ක් ලබාදී ඇති බවයි. ඒ අනුව තාවකාලික ලේඛනයේ පැමිණිලිකරුගේ දරුවාගේ නම ඇතුළත් කර ප්‍රදර්ශනය කර තිබියදී ඉදිරිපත්ව තිබූ විරෝධතාවයක් පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂිකා ඩබ්.ඒ.එන්.ඩී. රණසිංහ මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් අභියාචනා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය අදාල විරෝධතාව පරීක්ෂා කර ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරුගේ ආසන්න පාසලකට ලකුණු 5 ක් අඩු කළයුතු බවට එම මණ්ඩලය නිර්දේශ කර තිබූ බවත්, ඒ අනුව අයදුම්කරුගේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 85 දක්වා අඩුවී ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරු වන බණ්ඩාර මහතාගේ දරුවාගේ නම පොරොත්තු ලේඛනයේ 09 වන ස්ථානයේ තැබීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත. ඒ අනුව තමන් මෙහිදී කටයුතු කර ඇත්තේ, අභියාචනා විරෝධතා මණ්ඩලය විසින් ලකුණු ලබාදී ඇති පරිදි වන අතර, මෙම තත්වය මත තමන් නීතියට පටහැනිව කටයුතු කර නොමැති බවත්, පැමිණිලිකරු තමන් සම්බන්ධයෙන් ද්වේශ සහගත ලෙස කටයුතු කරමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

**කැගලු විද්‍යාලයේ වත්මන් විදුහල්පති එන්.ජී.ඩී.ආර්.හේමන්ත මහතාගේ කරුණු දැක්වීම -**

මෙම පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයේදී මානව හිමිකම් කොමිෂන් සභාව වෙත අදාළ පාර්ශවකරුවන් කැඳවා විමසීමේදී වත්මන් විදුහල්පති හේමන්ත මහතා ප්‍රකාශ කර ඇත්තේ, තමන් මෙම පාසලේ විදුහල්පති තනතුරේ වැඩ බාර ගැනීමට පෙර 2022 වසරේ කැගලු විදුහලේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ කටයුතු සහ අභියාචනා විරෝධතා පරීක්ෂා කිරීමේ කටයුතු අවසන් කර ඒ ඒ ගණයන් යටතේ දරුවන් ඇතුළත් කරගෙන තිබූ බවයි. කෙසේ වෙතත් මෙම පැමිණිල්ලට අදාළව හිටපු වැඩබලන විදුහල්පතිවරයා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇති බවත්, මේ වනවිට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ පළමු ශ්‍රේණියේ පුරප්පාඩු 04 ක පමණ ප්‍රමාණයක් ඇතිව තිබෙන බවත්, පැමිණිලිකරු වන බණ්ඩාර මහතාගේ දරුවාට පෙර තවත් දරුවන් සිව් දෙනෙකු පොරොත්තු ලේඛනයේ රැදී සිටින බවත්, මේ වනවිට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ පොරොත්තු ලේඛනයෙන් දරුවන් 5 දෙනෙකු ඇතුළත් කරගෙන ඇති අතර, මානව හිමිකම් කොමිසම විසින් පැමිණිලිකරුගේ දරුවා තම පාසලට ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් නිර්දේශ කරනු ලබන්නේ නම් අදාළ පුරප්පාඩුවක් සඳහා පැමිණිලිකරුගේ පුත්‍රයා ඇතුළත් කර ගැනීමට තමන්ගේ අකමැත්තක් නොවන බවත් ප්‍රකාශ කර ඇත.

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ එම්.සී.පලාවෙල මියගේ කරුණු සැළ කිරීම -**

මෙම පැමිණිල්ලට අදාළව 2023-03-03 දින පැවති පරීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යක්ෂවරයා නියෝජනය කරමින් සහභාගී වී ඇති ඉහත නිලධාරිනිය ප්‍රකාශ කර ඇත්තේ,

මෙම පැමිණිල්ලට අදාළව සිදුකරන ලද පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති සමස්ත කරුණු සහ වත්මන් විදුහල්පතිවරයා ඉදිරිපත් කරන ලද කරුණු ද සැලකිල්ලට ගැනීමේදී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් ලබා දෙන තීරණය/ නිර්දේශය පරිදි කටයුතු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයට බාධාවක් නොමැති බවයි.

**සාක්ෂිකරුගේ ප්‍රකාශය =:**

මෙම පැමිණිල්ලට අදාළව සාක්ෂිකරුවෙකු ලෙස කැඳවා ඇති 76/1 පී. පුවක්දෙනිය. කෑගල්ල ලිපිනයේ පදිංචි පල්ලෙකොටුව රාලලාගේ සම්පත් ප්‍රදීප් කුමාර යන අය 2023-03-03 දිනැති පරීක්ෂණයේදී සඳහන් කර ඇත්තේ, කෑගලු විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති ලිඛිත සැළ කිරීමක් මගින් දක්වා ඇති පරිදි තමන් විසින් මෙම පැමිණිලිකරු වන බණ්ඩාර මහතා සම්බන්ධයෙන් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත විරෝධතාවයක් ඉදිරිපත් කර නොමැති බවත්, කොමිෂන් සභාව වෙත වැඩබලන විදුහල්පතිවරයා ලබාදී ඇති එම ලේඛනය ව්‍යාජ එකක් බවත්, එහි ලිපිනය නිවැරදි වුවත් තමාගේ නම පී.කේ.ආර්ජේ.කුමාර නොවන බවත්, තමාගේ නිවැරදි නම ඉහත සඳහන් පරිදි බවත්ය. කෙසේ වෙතත් තම දරුවා කෑගලු විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ 2022 වසර සඳහා අයදුම් පත්‍රයක් යොමු කර සම්මුඛ පරීක්ෂණයට සහභාගි වුවත් මේ වනවිට තම දරුවා වෙනත් පාසලකට ඇතුළත් කර හොඳින් අධ්‍යාපන කටයුතු සිදු කරගෙන යනු ලබන බවත්, තමන් පොලිස් දෙපාර්තමේන්තුවට අයත් පොලිස් විශේෂ කාර්ය බලකායේ ගෝනහේන කඳවුරේ මානව සම්පත් කළමණාකරන කොට්ඨාශයේ සැරයන්වරයෙකු ලෙස සේවය කරනු ලබන බවත් ප්‍රකාශ කර ඇත. ඊට අමතරව 2023-03-06 දාතමින්ද මේ සම්බන්ධව පරීක්ෂණ නිලධාරිගේ උපදෙස් පරිදි වැඩිදුර කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇති අතර, එමගින්ද ඔහු ප්‍රකාශ කර ඇත්තේ, තමන් පැමිණිලිකරු වන බණ්ඩාර මහතා සම්බන්ධයෙන් කෑගලු විද්‍යාලයේ 2022 වසරේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාළ අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත විරෝධතාවයක් ඉදිරිපත් කර නොමැති බවත්, එවැනි විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට තමන්ට අවශ්‍යතාවයක් නොතිබූ බවත්ය.

**විමර්ශනය =:**

මෙම පැමිණිල්ලට අදාළව පැමිණිලි පාර්ශවය වගඋත්තරකරුවන් සහ සාක්ෂි ලබාදී ඇති ලිඛිත හා වාචික කරුණු සැලකිල්ලට ගැනීමේදී.

- පැමිණිලිකරු වන එම්.ආර්.පී.එම්.ආර්. බණ්ඩාර යන අය 2022 වසරේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ තම දරුවා කෑගලු විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර

ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍රය සලකා බැලීමෙන් අනතුරුව මුළු ලකුණු 90 ක් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

- එම වසරේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ කැගලු විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමට අදාල කඩඉම් ලකුණ වී ඇත්තේ ලකුණු 90 බව නිරීක්ෂණය වේ.

- හිටපු වැ.බ.වීරසිංහ මහතා ලබාදී ඇති ලිඛිත පිළිතුරෙහි සඳහන් පරිදි පැමිණිලිකරු වන බණ්ඩාර මහතාට එරෙහිව පී.කේ.ආර්.ජේ.කුමාර. පී 70/1. පුවක්දෙණිය. කැගල්ල ලෙස විරෝධතාවයක් ඉදිරිපත්ව ඇති බව සඳහන් කර තිබුණත් අදාල ලිපිනයේ පදිංචි පල්ලේකොටුවේ රාලලාගේ සම්පත් ප්‍රදීප් කුමාර නමැති සාක්ෂිකරු කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, අදාල ලිපිනයේ පදිංචිව සිටින්නේ තමා වුවත් තමන් පී.කේ.ආර්.ජේ.කුමාර නොවන බවත් සහ තමන් පැමිණිලිකරුට එරෙහිව විරෝධතාවයක් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොමැති බවත් ය.

- වැඩිදුර විමර්ශනය සඳහා වගඋත්තරකාර පාර්ශවයක් ලෙස කැඳවා ඇති අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාව නියෝජනය කරනු ලබන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ එම්.සී. පළාවෙල මහත්මිය ප්‍රකාශ කර ඇත්තේ, මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශයක් ලබා දෙන්නේ නම් ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා කැගලු විදුහලේ පළමු ශ්‍රේණියට හෝ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කිරීමට අමාත්‍යාංශයට හැකියාව ඇති බවය.

- 2022 වසරේ කැගලු විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමට අදාල අභියාචනා විරෝධතා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කර ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂිකා ඩබ්.ජ්.එම්.ඩී.රණසිංහ මිය බවත්, පැමිණිලිකරු වන බණ්ඩාර මහතා සම්බන්ධයෙන් ඉදිරිපත් වූ බව සඳහන් විරෝධතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔහුට ලබාදී ඇති මුළු ලකුණු ප්‍රමාණය (90 ) වෙනස් කිරීමට අභියාචනා විරෝධතා මණ්ඩලය කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවේ.

**නිගමනය -:**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති පරිදි 2023 වසරේ රජයේ පාසල් වල පළමු ශ්‍රේණියට සිසුන් ඇතුලත් කර ගැනීමට අදාළ 28/2022 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව කැගලු විදුහලේ හිටපු වැ.බ.විදුහල්පති ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇති බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික

අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය -:**

ඒ අනුව පැමිණිලිකරු වන එම්.ආර්.පී.එම්.ආර්. බණ්ඩාර යන අයගේ පුත්‍රයා වන කණිෂ්ක ගීනාත් බණ්ඩාර දරුවා 2023 වසරේ කැගලු විද්‍යාලයේ පළමු ශ්‍රේණියට හෝ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් විදුහල්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 05 . 08 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත =: 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/